# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන සංසදය

METH SAVIYA NEWS LETTER

• සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව • 2003 සැප්තැම්බර් 15 • පළමු කලාපය

### අප ගැන වචනයක්........

මනස අධ්‍යාපන සංවර්ධන සංසදය නිරවුල් මනසක් ඇති වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාල විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයින් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මෙමගින් පවත්වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයින්ගේ කැමැත්ත / ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත්වන අන්දම 'කාල කළමනාකරණය', 'නායකත්වය', 'ත්‍රෛයිමාසික භාවනා වැඩ සටහන්' වැනි ඒ ඒ කාලවලදී පවත්වන වැඩ සටහන් සඳහා සහභාගිවීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයින්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක් දාන - ශීල - භාවනා වැඩ සටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරන විධායක කමිටු හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රිය පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

### ඇතුළත පිටු

- සංසදයේ පසුගිය වැඩ සටහන් හා ඉදිරි සැලසුම්
- ඉදිරි දාන - ශීල - භාවනා වැඩ සටහන් පවත්වන දින
- මීළඟ ත්‍රෛයිමාසික භාවනා වැඩ සටහන
- මෙතෙක් සිදු කළ සමාජ සේවා ක්‍රියාකාරකම්



කොළඹ බෞද්ධාලෝක මාවතේ ධර්ම ගවේෂී බෞද්ධ ආශ්‍රමයේදී ප්‍රථම භාවනා වැඩසටහන පැවැත්වෙන අවස්ථාවක්...

### සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු

**● දාන - ශීල - භාවනා වැඩ සටහන 05.10.2003**

සැප්තැම්බර් 7 වන දින පැවති රැස්වීම් වාරයේදී තීරණය වූ පරිදි මීලඟ ත්‍රෛමාසික දාන - ශීල - භාවනා වැඩ සටහන ඔක්තෝම්බර් මස 5 වන ඉරු දින කඳුබොඩ ජාත්‍යන්තර සමථ විපස්සනා භාවනා මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

කෙළින්ම කඳුබොඩට පැමිණෙන සාමාජිකයින් පෙරවරු 8.30 වන විට පැමිණිය යුතුය. කොළඹ සිට පැමිණෙන අය සඳහා බස්රථ සංවිධානය කරනු ලැබේ. මේ සඳහා පැමිණෙන අය පෙරවරු 7.00 ට කොළඹ බෞද්ධාලෝක මාවතේ පිහිටි ධර්ම ගවේෂී බෞද්ධාශ්‍රමයට පැමිණිය යුතුය. සංසදයේ සාමජික හැඳුනුම්පත් සඳහා ඡායාරූප ගැනීම පෙරවරු 7.00 සිට 7.30 දක්වා සිදු කරන අතර ඉන්පසු පෙරවරු 7.30 ට පමණ බස්රථ කඳුබොඩ බලා මෙම ස්ථානයෙන් පිටත්වනු ඇත. සියලු බෞද්ධ සාමාජිකයින් අටසිල් සමාදන් වීම සඳහා සුදුසු ඇඳුමකින් සැරසී පැමිණිය යුතුය. බෞද්ධ නොවන සංසදයේ සාමාජිකයින්ටද මේ සඳහා ආරාධනා කරනු ලැබේ.

කොළඹ සිට වෙන්කල බස් රථයෙන් යෑම සහ ඒම සඳහා බරපැන රු.100 කි. බස් රථයේ යෑමට සහභාගිවන අය මේ පිළිබඳ ආසන වෙනකර ගැනීම සඳහා ඔක්තෝම්බර් 02 වෙනි දිනට පෙර සංසදයේ ලේකම් (දුරකථන 0722-177621) හෝ සංසදයේ නගර කාර්යාලය (දුරකථන 0722-764309) අමතා දැන්විය යුතුය.

**පිටකොටුවේ සිට පැමිණෙන බස් මාර්ගය :** ගුණසිංහපුර ආසන්නයේ ප්‍රධාන මාවතේ නවතනු ලබන 224 - පුගොඩ හෝ 225 - කිරිඳිවැල යන බස් රථ වලින් පැයක

ගමන් කාලයක් තුලදී සඳුබොඩ භාවනා මධ්‍යස්ථානයට පැමිණිය හැකිය. නොඑසේ නම් 234 - දෙල්ගොඩ හෝ 228 - ගම්පහ බස්රථ වලින් පැමිණ දෙල්ගොඩ හන්දියෙන් බැස පුගොඩ මාර්ගයේ යන පුගොඩ, හංවැල්ල, කිරිඳිවැල බසයක හෝ ත්‍රිරෝද රථයක පැමිණ කි.මී. 3 ක් පමණ දුරින් පිහිටි සඳුබොඩ භාවනා මධ්‍යස්ථානයට පැමිණිය හැකිය.

සඳුබොඩ භාවනා මධ්‍යස්ථානයට කෙලින්ම පැමිණෙන අයගේ හැඳුනුම්පත් වලට ඡායාරූපය ගැනීම සඳහා වෙනම වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ලැබේ.

## එදින වැඩ සටහන

| | | |
|---|---|---|
| පැය | 0830 - 0900 | අටසිල් සමාදන් කර වීම. |
| | 0900 - 0930 | භාවනා මධ්‍යස්ථානය නැරඹීම සහ ගිලන්පස (ගිලන්පස සැපයීමේ දානමය පුණ්‍යකර්මය සාමාජිකා නයනි දම්මි පෙරේරා මෙනෙවිය විසිනි). |
| | 0930 - 1030 | භාවනාව. |
| | 1030 - 1130 | සමූහ භාවනාව |
| | 1130 - 1145 | බුද්ධ පූජාව |
| | 1145 - 1230 | මනසිකාරයෙන් යුතුව දානය වැළඳීම (එදින දහවල් දානය සැපයීම අසෙලා කුරුප්පු ආරච්චි මිය (170) සහ දීපා චාන්දනී රොද්‍රිගෝ මිය (144) ඇතුළු පිරිස විසිනි) |
| | 1230 - 1300 | පුණ්‍යානුමෝදනාව සහ කමිටු රැස්වීම. |
| | 1300 - 1430 | සඳුබොඩ ජාත්‍යන්තර භාවනා මධ්‍යස්ථානයේ ප්‍රධාන කම්මට්ඨානාචාර්ය පූජ්‍ය මඩවල උපාලි ස්වාමීන් වහන්සේ විසින් පවත්වනු ලබන ධර්ම දේශනාව / සාකච්ඡාව. |
| | 1430 - 1500 | සක්මන් භාවනාව. |
| | 1500 - 1515 | ගිලන්පස (සැපයීම නයනි දම්මි පෙරේරා මෙනෙවිය විසිනි). |
| | 1515 - 1700 | දේශනය - මනෝ විද්‍යාත්මක ඇසකින් කර්මය (දේශක ආචාර්ය චන්දන ජයරත්න). |
| | 1700 - 1705 | වැඩසටහන් නිමාව. |

*ඉහත වැඩ සටහන අප සංසදයේ දාන - ශීල - භාවනා - කමිටුවේ මෙහෙය වීමෙන් සිදුවේ.*

මෙවැනි දාන ශීල භාවනා වැඩ සටහන් සෑම මාස තුනකටම වරක් භාවනා මධ්‍යස්ථානයකදී පැවැත්වීමට 07.09.2003 පැවති රැස්වීම් වාරයේදී තීරණය විය. මේ අනුව ඉදිරි දාන ශීල භාවනා වැඩ සටහන් සෑම මාස තුනකටම වරක් පහත සඳහන් පළමු ඉරුදින වලදී පැවැත්වේ.

**2003 ජනවාරි මස 4 වෙනි දින**
**2004 අප්‍රේල් මස 4 වෙනි දින**
**2004 ජූලි මස 4 වෙනි දින**
**2004 ඔක්තෝම්බර් මස 3 වෙනි දින**

නවක සාමාජිකයින් සඳහා වන මීලඟ ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩ සටහන ඔක්තෝම්බර් මස 28 වෙනි ඉරු දින ප.ව. 1.30 සිට 3.30 දක්වා පැවැත්වේ. 07.09.2003 රැස්වීමේදී ගත් තිරණ පරිදි පළමු භාවනා වැඩ සටහනට සහභාගිවූ සාමාජිකයින්ට මසකට වරක්වත් මුණගැසීමේ අවස්ථාවක් තිබීම භාවනා කටයුතු වර්ධනය කරගැනීමට මහත් රුකුලක් වන බව පෙනී ගිය හෙයින් සෑම මසකම පළමුවන ඉරු දින පස්වරු 1.00 - 2.00 දක්වා කාලයතුල එය දෙවන භාවනා වැඩසටහන පවත්වන ස්ථානයේදීම පවත්වනු ලැබේ. අවශ්‍ය අයට එදින ඉන් අනතුරුව පැවැත්වෙන දෙවන කණ්ඩායමේ භාවනා වැඩ සටහනටද සහභාගිවීමට හැකිය. ඉහත වැඩසටහනද පළමු වැඩසටහන පැවැත්වූ ස්ථානයේදීම පැවැත්වේ.

## සංසදය මගින් මෙතෙක් සිදුකල ක්‍රියාකාරකම්

1. සාමාජකයින් 280 වක් සඳහා ප්‍රථම චිත්ත සංයම වැඩ සටහන සහ භාවනා වැඩ සටහන කොළඹ 7. බෞද්ධාලෝක මාවතේ ධර්ම ගවේශී ආශ්‍රමයේදී පොසක් තුල සෑම ඉරු දිනකම පවත්වා සාර්ථකව නිම කරන ලදී.

අවසන් වැඩ සටහන 13 වන ශතවර්ශයේදී භුවනෙකබා රජතුමා විසින් ගොඩනගන ලද, පැරණි ගල්ලෙන් වලින් යුත් භාවනා කුටි සහිත හංවැල්ල අඹුල්ගම රජ මහා විහාරස්ථානයේදී 07-09-2003 මුළු දිනය පුරාම පවත්වන ලදී. මෙදින පිරිස සිල් සමාදන් කරවන ලද්දේ එම විහාරස්ථානයේ නායක දංකන්දේ බෝධිවංශ ස්වාමින් වහන්සේ විසිනි.

### මෙදින දානය සැපයීම සහ පරිත්‍යාග :-

දහවල් දානය සංසදයේ සභාපති අචාර්ය චන්ද්‍රන ජයරත්න මහතා සහ සාමාජිකාවක් වන අමරා විජේසේකර (330) මහත්මිය විසින් පිරිනමන ලදී. උදේ සහ දහවල් ගිලන් පස සැපයීම තිසේරා මහතා සමග මෙම විහාරස්ථානයේ දායක සභාව විසින් සිදු කළහ.

රහතුන් වැඩසිටි භාවනා මධ්‍යස්ථානය නගා සිටුවීම සඳහා ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් එදින ශිල භාවනා වැඩ සටහනට සහභාගිවූ සංසදයේ සියලු සාමාජිකයින් විසින් මහත් බැති සිතින් යුතුව රු : 11,830/- මුදලක් පරිත්‍යාග කළහ. (මෙම මුදලට බස් රථයෙන් ඉතිරිය වශයෙන් ලැබූ රු : 1800/- මුදලද අයත් වේ.) මෙම විහාරස්ථානයේ අධිපති ස්වාමින් වහන්සේ විසින් මෙම මුදල පුණ්‍යානුමෝදනා පූර්වකව භාර ගන්නා ලදී,

2. මිට අමතරව එම භාවනා මධ්‍යස්ථානයේ අලුතෙන්ම සක්මන් මළුවක් තැනීම සඳහා අවශ්‍ය යැයි පැවසූ රු.15,000/- ක මුදල ලබා දීමට සංසදයේ සාමාජිකාවක් වන කුමුදුනි යාපා මහත්මිය (219) සහ අනෝමා රණවීර මහත්මිය (363) ඉදිරිපත් වූ අතර සැදැහැවතියන් දෙදෙනෙක් වන හෙලන් තිලකා කහවේ විදාන (249) සහ තවත් සාමාජිකාවක් විසින් ද එම කටයුත්ත සඳහා තවත් රු.3,000/- ක් පරිත්‍යාග කිරීමට පොරොන්දු වූහ. තිසේරා ආයතනය විසින් ගිලන් භික්ෂූන්ගේ බෙහෙත් සහ සේවක වේතන ගෙවීම සඳහා රු :8000/- ක මුදලක් විහාරස්ථානයට පූජා කර ඇත.

## 3. අසරණ සරණ සාමාජික සේවා

මහස අධ්‍යාපන සංවර්ධන සංසදය මගින් ශංවතුර කාලයේ ඇතිවූ සුළි සුළං තත්වය මත කැඩුණු කටු මැටි නිවසක සිටි කිසිදු හවි හරනක් නැති ඉතා දුර්වල ශරීරයක් සහිත මතුගම පාන්තිය බිලිගහ කන්දේ වෙසෙන මවක් සහ දියණියකට නිවසක් තනා දීම සඳහා සාමාජිකයින්ගෙන් එකතු කළ රු : 4,546 මුදල කිසිසේත් නොසෑහෙන බැවින් මෙහිදී එම මහගු පුණ්‍ය කර්මය සඳහා තම පෞද්ගලික ධනය පරිත්‍යාග කිරීමට ලියෝ හෝල්ඩිං සහ ග්‍රීන් බැම්බූ ප්ලාන්ටේශන් සමාගම් වල අධ්‍යක්ෂ වරයෙකු වන අප සාමාජික උදය පිරිස් මහතා (335) ඉදිරිපත් විය.

### මරණයට කැපවූ පක්ෂීන් සහ සිවුපා සතුන් සඳහා වන අරමුදල :-

ඉහත සඳහන් කටයුත්ත සඳහා සංසදයේ සාමාජිකයින් විසින් තනි තනිව එක්රැස් කරනු ලබන මුදල් වෙතොත් ඉදිරි ශිල භාවනා වැඩ සටහන් වලදී සතුන් නිදහස් කිරීමට කැමති අය එම මුදල් 05-10-2003 දින හෝ 2004 ජනවාරි දිනවල ශිල - භාවනා වැඩ සටහන් පැමිණෙන විට රැගෙන එන්න.

*සංසදයේ නිලධාරි මණ්ඩලයේ සහ කමිටු සාමාජික භවතුන්ගේ නිවැරදි නාම ලේඛනයක් දෙසැම්බර් කලාපය සමගින් බලාපොරොත්තු වන්න.*

### අසරණ සරණ සේවා

ඔබ පවුලේ කෙනෙකු හෝ අසල් වැසියෙකු අසරණ තත්වයට පත්ව තිබේනම් අප සංගමය හරහා උදව් කිරීම අපගේ යුතුකමකි. විස්තර අසරණ සරණ සේවා කමිටුවට හෝ සභාපති / ලේකම්ට දැනුම් දෙන්න.

**මෙත් සවියෙන් තිලිණයක්...**

නිති පන්සිල් රැකීමේ ආනිසංස දැක්වෙන කහ පැහැ කඩදාසියේ මුද්‍රිත පෝස්ටරයක් මේ සමග එවා ඇත. ලැමිනේට් කිරීම සඳහා අවශ්‍ය නම් තවත් පිටපතක් ලබා දිය හැක.

### නගර කාර්යාලය සඳහා සුදුසු ස්ථානයක් ලබාගැනීම

*සංසදයේ නගර කාර්යාලය සඳහා හා අනු කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා අඩු මාසික මුදලකට කොළඹ නගරයෙන් ලබාගත හැකි ස්ථානයක් තිබේනම් සභාපති (0777 309385) අමතා සති දෙකක් තුල දැනුම් දෙන්නේ නම් කෘතඥ වෙමු.*

## විශේෂ පුණ්‍යානුමෝදනාව

ප්‍රථම භාවනා වැඩසටහන පැවැත්වීම සඳහා අපවෙත ශාලා පහසුකම් සපයාදුන් කොළඹ බෞද්ධාලෝක මාවතේ ධර්ම ගවේෂී බෞද්ධ ආශ්‍රමයේ විහාරාධිපති වහන්සේට සහ එම ශාලාව තැනූ දායක පිංවතුන්හට එවැනි කුසල් තව තවත් කිරීමේ ශක්තිය පහල වේවා යැයිද, අවසානයේ සහමොක් සුවද ප්‍රාර්ථනා කරමු.

### *වැදගත් අවස්ථා කිහිපයක්........*



**අප්‍රමාදව පටවෙන් වලකින්න පිං කරන්න.**

එවිට අකුසල විපාකවූ දුක් විපාක දුරුවී කුසල විපාක වූ සැප විපාක ලැබෙයි. නොමග ගිය සියලු ජාතිකයින් සියල්ලෝම වහා ශීලයක පිහිටා තැත්පත් හිතෙන් ලොවසැම දෙයම අනිත්‍යයි, දුකයි. විශේෂයෙන් අනාත්මය කියා විස්තරාත්මකව භාවනාවක් වශයෙන් සිතන්න. එවිට නිවන ලැබෙයි.







07-09-2003 වන ඉරු දින සංසදයේ සාමාජිකයින් සඳහා පැරණී ගල් ලෙන් සහිත අඹුල්ගම රජ මහා විහරස්ථානයේ පැවැත්වූ දාන ශිල භාවනා වැඩසටහනේ ඡායාරූප





සංසදය විසින් පවත්වන ලද ප්‍රථම අසරණ සරණ වැඩසටහනේදී සංසදය වෙනුවෙන් එහි සාමාජික උදය පිරිස් මහතා විසින් මෙම මතුගම අසරණ පවුල වෙත රු : 35,000/- ක මුදලක් 19-09-2003 දින මතුගම බිලිගහ කන්දේදී පරිත්‍යාග කරන අවස්ථාව ඉහත ඡායා රූපවලින් දැක්වේ. (මෙම අවස්ථාවට සංසදයේ සභාපති අචාර්ය චන්දන ජයරත්න, ලේකම් රෝෂන් ඉන්දු සහ සාමාජික මහතෙකු වන ධනුෂ්ක බණ්ඩාර ද සහභාගි වූහ.

**ප්‍රකාශන කමිටුව වෙනුවෙන් සංසදයේ සංස්කාරක විසින් සම්පාදිතයි.**

අංක 60, පැහිරිවත්ත පටුමග ගංගොඩවිල - නුගේගොඩ දුරකථන අංක 0722-177621; 0722 -764309